*සැ. යු.* - 2023.02.24 දින පළ කරන ලද අංක 2321 *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,322 - 2023 මාර්තු මස 03 වැනි සිකුරාදා - 2023.03.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | — | පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| බදුබාහිරාදිය විකිණීම් ... ... ... | — | අයවැය ලේඛන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 388 | දේපළ විකිණීම් ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | 390 |


සැ. යු. - (i) බෙදුම් නඩු (සංශෝධන) පනත් කෙටුම්පත 2023 පෙබරවාරි මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ශ්‍රී ලංකා මහ බැංකුව පනත් කෙටුම්පත 2023 පෙබරවාරි මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 මාර්තු මස 24 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 මාර්තු මස 10 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

387- B 82434— 5,403 (2023/03)

# පළාත් පාලන නිවේදන

## තවලම ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය ප්‍රකාරව දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තවලම ප්‍රාදේශීය සභාවේ 2022.12.20 වැනි දින පැවති මහ සභා රැස්වීමේදී උපලේඛනයේ සඳහන් මාර්ගය නාමය පහත පරිදි සංශෝධනය වූ බව තවලම ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති බන්දුල විජේසේකර මැතිතුමාගේ හා තවලම ප්‍රාදේශීය සභාවේ ගරු උපසභාපති ආනන්ද රත්නායක මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත වූ බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බන්දුල විජේසේකර,
සභාපති,
තවලම ප්‍රාදේශීය සභාව.

තවලම ජෙස්මින්වැලි බිරියදොළ පාලම අසල සිට බිරියදොළ හරහා පොළොන්ඔවිට, තවලම උප තැපැල් කාර්යාලය, දක්වා පාර ලෙස *ගැසට්* වී ඇති මාර්ගය පහත පරිදි සංශෝධනය විය යුතුය.

| *මාර්ගයේ නම* | *ග්‍රාම සේවා වසම* | *ආරම්භය* | *අවසානය* | *පළල* | *දිග* |
|---|---|---|---|---|---|
| තවලම ආදාහනාගාරය ඉදිරිපිට බිරියදොළ පාලම අසල සිට බිරිය දොළ දිගේ සිට දංවැලක් ඇතුළත මහ පොලොන්ඕවිට දක්වා ගොස් බිරියදොළින් එගොඩ වී තවලම උපතැපැල් කාර්යාලය දක්වා මාර්ගය | තවලම උතුර | ජෙස්මින්වැලි ආදාහනාගාරය ඉදිරිපිට | තවලම උප තැපැල් කාර්යාලය | මී 6.00 | මී 1.00 |

03-52

---

## අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව

### වීථි නම් කිරීම

අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභා බල සීමාව තුළ පිහිටි පහත උපලේඛනයේ නම් සඳහන් වෙන්දේසිවත්ත මාර්ගය, කහටගහවත්ත එකමුතු මාවත ලෙස නම් කිරීම සඳහා ප්‍රාදේශීය සභාවේ යෝජනා සම්මත කරන ලදුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය හා 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2(1) (අ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇත.

ඒ අනුව මාර්ගය මින් ඉදිරියට යෝජිත නාමයෙන් හැඳින්වීමට කටයුතු කරන බව මින් නිවේදනය කරමි.

සභාපති,
අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව.

**උපලේඛනය**

| *මාර්ගය* | *යෝජිත මාර්ගය* |
|---|---|
| 01. වෙන්දේසිවත්ත මාර්ගය | කහටගහවත්ත එකමුතු මාවත |

03-32

## කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

ගෝසාතක ආඥාපනත 272 වන අධිකාරිය යටතේ කරන දැනුම් දීමයි

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ නම සඳහන් වන අය විසින් ඔහුගේ නමට ඉදිරියෙන් සඳහන් කර ඇති ස්ථානයෙ හි ඌරු මස් අලෙවිසැලක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ඉල්ලමින් අයදුම්පත්‍රයක් මා වෙත ඉදිරිපත් කර ඇති බවත් එම බලපත්‍රය නිකුත් කිරීම සම්බන්ධයෙන් කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙකු විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතුව ලිඛිතව පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළ වූ දින සිට දින 21 ක් ඇතුළත මා වෙත දන්වා එවිය යුතු බවත් ගෝසාතක ආඥාපනතේ 272 වන අධිකාරියේ අංක 7(2) වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

**උපලේඛනය**

| *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *ස්වභාවය* | *ඉදිකරන ස්ථානය* |
|---|---|---|
| එච්. එම්. ජයන්ත හේරත්<br>යඳල්ගොඩවත්ත,<br>යාකරවත්ත,<br>කිතලව. | ඌරුමස් අලෙවි සැල | අංක 8116 සහ 1999.07.05 දිනැති ඔප්පුවේ සඳහන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොල හත්පත්තුවේ යටිකහ දකුණු කෝරලයේ නාරංගල්ලේ පිහිටි නාරංගල්ල ඉඩමේ කට්ටි අංක 14 සහ 15 දරන ඉඩම |

ආර්. ඩී. කල්‍යානී අමරජීව,
ලේකම්,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව,
කුලියාපිටිය.

2023 පෙබරවාරි මස 20 වැනි දින.

03-40

---

## උකුවෙල ප්‍රාදේශීය සභාව

ගෝසාතක ආඥාපනත (272 වැනි අධිකාරිය)

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ නම් සඳහන් අය විසින් ඔහුගේ නමට ඉදිරියේ ඇති ස්ථානයේ 2023 වර්ෂය සඳහා එළගවමස් අලෙවිසැලක් පවත්වාගෙන යාම පිණිස බලපත්‍රයක් ඉල්ලා ඇති බැවින් ඒ අනුව එකී අයට බලපත්‍රයක් ලබා දීම සම්බන්ධයෙන් උකුවෙල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ඇතුළත පදිංචි වී සිටින යම් අයෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට සාධාරණ හේතු සඳහන් කර ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළ වූ දිනයේ සිට දින 14ක් ඇතුළත ලියාපදිංචි කළ තැපෑලෙන් මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩී. ඩබ්. එම්. චේතියරත්න.
සභාපති,
උකුවෙල ප්‍රාදේශීය සභාව.

2023 ජනවාරි මස 10 වැනි දින,
උකුවෙල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *වෙළඳාමේ ස්වභාවය* | *වෙළඳාම් කරන ස්ථානය* |
|---|---|---|
| ඒ. එම්. ෆාරිස්,<br>අංක 6,<br>නුවර පාර,<br>උකුවෙල | එළගවමස් වෙළඳසැලක් පවත්වාගෙන යාම | අංක 6/1, නුවර පාර, උකුවෙල |

03-23

# විවිධ දැන්වීම්

## සංශෝධනයයි

### උකුවෙල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයේ පෙබරවාරි මස 14 වැනි දින පවත්වන ලද උකුවෙල ප්‍රාදේශීය සභා රැස්වීමේ දී තීරණ අංක ඉ:1:13 යටතේ 2023 වර්ෂයට අදාළව 2022 නොවැම්බර් මස 25 වැනි දින අංක 2308 *ගැසට්* පත්‍රයේ පළ කරන ලද්දා වූ උකුවෙල ප්‍රාදේශීය සභාව මගින් අයකරනු ලබන විවිධ ගාස්තු අය කිරීම පහත පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් නිවේදනය කරමි.

ඩී. ඩබ්. එම්. චේතියරත්න,
සභාපති,
උකුවෙල ප්‍රාදේශීය සභාව.

2023 පෙබරවාරි මස 14 වැනි දින,
උකුවෙල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

2023 වර්ෂය සඳහා උකුවෙල ප්‍රාදේශීය සභාව මගින් කුළියට දෙනු ලබන වාහන ගාස්තු පහත සඳහන් පරිදි 2023 වර්ෂයට පනවා අය කළ යුතු බව මෙයින් යෝජනා කරන්නීය.

**වාහන කුළියට ලබා දීම :**

| | *2022 නොවැම්බර් මස 25 දින ගැසට් පත්‍රයේ පළ වූ මුදල* | *2023 වසරට සංශෝධිත මුදල* |
|---|---|---|
| බැකෝ යන්ත්‍රය පැය 01 ක් සඳහා | රු. 6,000 0 | රු. 5,500 0 |

03-39

---

### උකුවෙල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා විවිධ ගාස්තු අය කිරීම

2023 වර්ෂයේ ජනවාරි මස 10 වැනි දින පවත්වන ලද උකුවෙල ප්‍රාදේශීය සභා රැස්වීමේ දී තීරණ අංක ඉ:1:2 හා ඉ.1.3 හා 2023 වර්ෂයේ අයවැය ලේඛනයේ වැඩසටහන් අංක 41-vi යටතේ 2023 වර්ෂයට උකුවෙල ප්‍රාදේශීය සභාව මගින් අය කරනු ලබන විවිධ ගාස්තු අය කිරීමේ යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩී. ඩබ්. එම්. චේතියරත්න,
සභාපති,
උකුවෙල ප්‍රාදේශීය සභාව.

2023 ජනවාරි මස 10 වැනි දින,
උකුවෙල ප්‍රාදේශීය සභාව.

**යෝජනාව**

2023 වර්ෂය සඳහා උකුවෙල ප්‍රාදේශීය සභාව මගින් කුළියට දෙනු ලබන විවිධ පෝරම ගාස්තු පහත සඳහන් පරිදි 2023 වර්ෂයට පනවා අය කළ යුතු බව මෙයින් යෝජනා කරන්නීය.

| | |
|---|---|
| යාලේගම ක්‍රීඩාංගනයේ ජල විදුලි පිරිවැය | |
| ජල ගාස්තුව | රු. 500 0 |
| විදුලි ගාස්තුව | රු. 500 0 |
| යාලේගම ක්‍රීඩාංගනයේ සයිඩ් විකට්ටුව සඳහා පැය 2 1/2 | රු. 500 0 |

ඉදිරිපත් කරනු ලබන සැලසුම සඳහා සැලසුම් ශිල්පීන්ගෙන් අය කරනු ලබන ගාස්තු :

| *වර්ග අඩි ප්‍රමාණය* | *මුදල* |
|---|---|
| වර්ග අඩි 2000 ට අඩු නම් එක් සැලසුමකට | රු. 1,500 0 |
| වර්ග අඩි 2000 ට වැඩි නම් එක් සැලසුමකට | රු. 3,000 0 |

03-24

---

**ගම්පහ මහා නගර සභාව**

ව්‍යාපාරික ස්ථානවලින් කුණුරොඩු ඉවත් කිරීම සඳහා සේවා ගාස්තු අය කිරීම - 2023

මහ නගර සභා ආඥාපනතේ 130 වන වගන්තිය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 541/17 සහ 1989.01.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙහි සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ X වන කොටසේ පීඩා වැළැක්වීම සම්බන්ධව අතුරු ව්‍යවස්ථාවෙහි 20 වන අතුරු ව්‍යවස්ථාව හා බස්නාහිර පළාත් සභාවේ 2007 අංක 01 දරන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරී ප්‍රඥප්තිය බස්නාහිර පළාත් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව ගම්පහ මහා නගර සභා සීමාව තුළ ව්‍යාපාරික ස්ථානවලින් කුණු රොඩු ඉවත් කිරීම සඳහා 2023 ජනවාරි පළමු වැනි දින සිට සේවා ගාස්තු අය කිරීමට තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුණු රොඩු යන්නෙන් "අළු, දූවිලි, අතුගා දමන ද්‍රව්‍ය, කුණු, මළ මුත්‍රා, ගොම, අපවිත්‍ර ද්‍රව්‍ය, කසළ හෝ වෙනත් ඉවතලන ඕනෑම ද්‍රව්‍යයන් අදහස් වේ."

ඉවත් කරන කුණු රොඩු ප්‍රමාණයන් සහ අය කරන ගාස්තු පහත සඳහන් වන පරිදි වන අතර 2023.01.01 දින සිට ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරන බව මෙයින් නිවේදනය කරමි.

| *දිනකට ජනනය වන කසළ ප්‍රමාණය (kg)* | *මසකට අය කරනු ලබන ගාස්තුව රු.* |
|---|---|
| ග්‍රෑම් 0 සිට කි. ග්‍රෑ. 5 දක්වා ප්‍රමාණයන් දිනකට ඉවත් කරන ආයතන සඳහා | 625 |
| කි. ග්‍රෑ. 6 - 10 දක්වා ප්‍රමාණයන් දිනකට ඉවත් කරන ආයතන සඳහා | 1,250 |
| කි. ග්‍රෑ. 11 - 15 දක්වා ප්‍රමාණයන් දිනකට ඉවත් කරන ආයතන සඳහා | 1,500 |
| කි. ග්‍රෑ. 16 - 20 දක්වා ප්‍රමාණයන් දිනකට ඉවත් කරන ආයතන සඳහා | 2,500 |
| කි. ග්‍රෑ. 21- 30 දක්වා ප්‍රමාණයන් දිනකට ඉවත් කරන ආයතන සඳහා | 5,000 |
| කි. ග්‍රෑ. 31 - 40 දක්වා ප්‍රමාණයන් දිනකට ඉවත් කරන ආයතන සඳහා | 7,500 |
| කි. ග්‍රෑ. 41 - 50 දක්වා ප්‍රමාණයන් දිනකට ඉවත් කරන ආයතන සඳහා | 11,250 |
| කි. ග්‍රෑ. 51 - 60 දක්වා ප්‍රමාණයන් දිනකට ඉවත් කරන ආයතන සඳහා | 15,000 |
| කි. ග්‍රෑ. 61 - 70 දක්වා ප්‍රමාණයන් දිනකට ඉවත් කරන ආයතන සඳහා | 18,750 |
| කි. ග්‍රෑ. 71 - 100 දක්වා ප්‍රමාණයන් දිනකට ඉවත් කරන ආයතන සඳහා | 25,000 |
| කි. ග්‍රෑ. 101 - 150 දක්වා ප්‍රමාණයන් දිනකට ඉවත් කරන ආයතන සඳහා | 31,250 |
| කි. ග්‍රෑ. 151 - 200 දක්වා ප්‍රමාණයන් දිනකට ඉවත් කරන ආයතන සඳහා | 37,500 |
| කි. ග්‍රෑ. 201 - 300 දක්වා ප්‍රමාණයන් දිනකට ඉවත් කරන ආයතන සඳහා | 43,750 |
| කි. ග්‍රෑ. 301 - 500 දක්වා ප්‍රමාණයන් දිනකට ඉවත් කරන ආයතන සඳහා | 50,000 |
| කි. ග්‍රෑ. 501 ට වැඩි ආයතන සඳහා | 56,250 |

නාගරික කොමසාරිස්,
ගම්පහ මහා නගර සභාව.

03-18

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

*මාසය* — *පළ කිරීමේ දිනය* — *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව*

**2023** වර්ෂය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **මාර්තු** | 2023.03.03 | සිකුරාදා | 2023.02.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.03.10 | සිකුරාදා | 2023.02.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.03.17 | සිකුරාදා | 2023.03.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.03.24 | සිකුරාදා | 2023.03.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.03.31 | සිකුරාදා | 2023.03.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අප්‍රේල්** | 2023.04.06 | බ්‍රහස්පතින්දා | 2023.03.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.04.12 | බදාදා | 2023.03.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.04.21 | සිකුරාදා | 2023.04.06 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2023.04.28 | සිකුරාදා | 2023.04.12 | බදාදා | දහවල් | 12.00 |
| **මැයි** | 2023.05.04 | බ්‍රහස්පතින්දා | 2023.04.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.05.12 | සිකුරාදා | 2023.04.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.05.19 | සිකුරාදා | 2023.05.04 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2023.05.26 | සිකුරාදා | 2023.05.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ - 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.